සැකසුම : ඉදුමිණි ශ්‍යාමා මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 23 මහියංගණ දාගැබ

ලංකාය යත්ත පඨමං සුගතෝ හියජ්ජ යක්ඛෙ ද මේසි නිජසාසනපාලනාය ඨානේ තහිං නිහිත කුන්තල ශිවධාතුං වන්දාමි සාධු මහියංගණ ථූප රාජං...

ආදරණීය දුවේ පුතේ ඔයාල දන්නවද අද මම ඔයාලය එක්ක යන්න සූදානම් වන්නේ කොහේද කියලා.

අප බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ශාසනය රකිනු සඳහා පළමුවර ලක්දිව යම් ස්ථානයක වැඩහිඳ යකුන් දමනය කළ සේක් ද ඒ ස්ථානයේ කේශ ධාතුන් හා ග්‍රීවා ධාතුව (උරහිස් ධාතුව) නිදන් කොට ගොඩනංවන ලද මහියංගණ චෛත්‍ය රාජයා වන්දනා කරන්නයි.ඔයාල හැමෝම කැමතියි නේද?

එහෙමනම් ඔයාලගේ බුද්ධ ධර්මය පෙළ පොත අතට ගන්නකෝ.23 වන පාඩම පෙරළාගෙන එහි තිබෙන පින්තූරය හොඳින් බලන්නකෝ.ඔයාල ඉහත සඳහන් වූ ගාථාව කියලා වන්දනා කරන්නේ ඔය දාගැබට තමයි.

ඉතින් ඔයාල මහියංගණ දාගැබ පිළිබඳ තොරතුරු දැන ගන්නත් ආසයි නේද? අපි ඒ පාඩම හොඳින් කියවමු.

හොඳයි පුතේ පාඩම තේරුම් ගත්තාද බලන්නයි මම දැන් සූදානම් වන්නේ.

- පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදිනම් ( x ) ලකුණද යොදමු.

1) මහියංගණයේ මහවැලි ගඟ අසබඩ යක්ෂ ගෝත්‍රික දෙපිරිසක් වාසය කළහ. (     )
2) යක්ෂ ගෝත්‍රික දෙපිරිස අතර ගැටුමක් ඇති නොවීය. (     )
3) බුදුරජාණන් වහන්සේ මහානාග වන උයනේ අහසේ වැඩ සිටියහ. (     )
4) ආරම්භයේදී මහියංගණ චෛත්‍ය රියන් 8ක් බව සඳහන් වේ. (     )

පහත වැකිවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරමු

1) බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමන සිදු වූයේ ......................( දුරුතු / වෙසක් ) පොහොය දිනකයි.
2) බුදුරජාණන් වහන්සේ මහියංගණයට වැඩමකළ බව දැනගෙන ............................( සුමන සමන් / කතරගම ) දෙවියෝ මහා පිරිසක් සමග එම ස්ථානයට පැමිණියහ.
3) බුදුරජාණන් වහන්සේ යමාමහ පෙළහර පෑ ස්ථානය ....................( දන්ත ධාතුව / කේශ ධාතුව ) නිදන් කර චෛත්‍යයක් කරවන ලදී.
4) බෞද්ධයන් සොළොස්මස්ථාන වන්දනා කිරීමේදී .........................(ප්‍රථමයෙන් / දෙවනුව ) වන්දනා කරන්නේ මහියංගණ චෛත්‍යයි.